ජනසමාජයක චින්තනය වෙනස් කිරීමට භාෂාවට ප්‍රබල හැකියාවක් ඇති නිසාම, භාෂා භාවිතයේදී මාධ්‍ය වෙසෙසින්ම ප්‍රවේසම් විය යුතු යැයි, ඒ පිළිබඳව සවිඥාණිකව කටයුතු කළ යුතු යැයි අපි කියමු. යම් යම් ආබාධ සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් දැක්වෙන පුවත් වාර්තාවන්හි භාවිතා වන භාෂාව සම්බන්ධයෙන්ද කථාබහ කළ යුත්තේ ඉහත දැක්වූ කරුණ නිසාම වේ.

යම් කිසි ආබාධයක් සහිත පුද්ගලයෙකු සම්බන්ධයෙන් කථා කිරීමේදී, එම අදාළ ආබාධය පුවතට අදාළ වේ නම්, ඔහුව හෝ ඇයව 'පුද්ගලයා මුල් කොට ගත් භාෂාවක්' (Person-first language) යොදාගනිමින් හැඳින්විය යුතු බව ලෝකයේ පිළිගත් සම්මුතීන් වල සඳහන් වේ. මෙයින් අදහස් වන්නේ පුද්ගලයා පළමුව පැමිණෙන බවත්, අදාළ ආබාධය ද්විතීයික වන බවත් වේ. උදාහරණ ලෙසින් දක්වන්නේ නම් A disabled person යන යෙදුම වෙනුවට A person with a disability යනුවෙන් හැඳින්වීම මනා යැයි දැක්වේ.

මෙවන් පුද්ගලයා මුල් කොට ගත් භාෂාවක් භාවිතා කිරීමෙන්, යම් යම් ආබාධ සහිත වූවන් කොන් වීමෙන් වැළැක්වීමටත්, ඔවුන්ද ජනසමාජයේම කොටසක් ලෙසින් වෙනසකින් තොරව දැක්වීමටත් ඉඩ ප්‍රස්තා ලැබෙනු ඇතැයි ඔබ නොසිතන්නේද? ඒ අනුව බැලූ විට, "ආබාධිත" යන යෙදුම වෙනුවට "ආබාධ සහිත" වැනි යෙදුමක් යෝග්‍ය යැයි ඔබ සිතන්නේද? එය යෝග්‍ය නොවේ යැයි සිතන්නේ නම්, ඒ වෙනුවට භාවිතා කළ හැකි වෙනත් යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?

මූලාශ්‍ර:
[http://www.disability.wa.gov.au/.../words_that_work_media...](http://www.disability.wa.gov.au/.../words_that_work_media...)
[https://adata.org/factsheet/ADANN-writing...](https://adata.org/factsheet/ADANN-writing...)

වැඩිදුර කියැවීම් සඳහා:
[http://cdrnys.org/.../the-disability-dialogue-4.../...](http://cdrnys.org/.../the-disability-dialogue-4.../...)
[https://www.and.org.au/pages/inclusive-language.html...](https://www.and.org.au/pages/inclusive-language.html...)

**#MediaEthicsSL #lka #SinhalaPress #News #SundayMawbima**
See Less